සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

පළමුවන වාරපරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
First Term Test - 2018 | Grade 11

කෘෂි හා ආහාර තාක්ෂණය II
Agriculture and Foof Technolohy II

කාලය පැය 2
Two hours

- පළමු ප්‍රශ්නය ද තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01. උතුරුමැද පළාතේ ගොවි මහතෙක් තමාගේ හෙක්ටයාර් 3 ක පමණ ගොඩ ඉඩම බෝග වගා කිරිමට තීරණය කළේය. භූමියේ එක් කොටසක් මද බෑවුම් සහිතය.

i. ඔහුගේ ඉඩමේ මූලික බිම් සැකසීමට යොදාගත් යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන උපකරණයක් සහ සත්ව බලයෙන් ක්‍රියාකරණ උපකරණයක් නම්කරන්න.

ii. බෑවුම් සහිත බිම් කොටසේ පාංශු ඛාදනය වැළැක්වීමට යොදා ගතහැකි යාන්ත්‍රික ක්‍රම 2 ක් නම්කරන්න.

iii. ඔහු වගාකර තිබූ වැටකොළු බෝගවල කුඩා රන්වන් පැහැති විනිවිද පෙනෙන පියාපත් සහිත මැස්සෙකු නිතර ගැවසෙනු දක්නට ලැබුනි.

අ) එම කෘමියා නම්කරන්න.

ආ) මෙම කෘමියාගේ හානිය කෙබඳුද ?

iv. මෙම ගොවිපළ පිහිටි ප්‍රදේශයේ බහුලව ව්‍යාප්ත පස් කාණ්ඩය කුමක්ද ?

v. මෙම ඉඩමේ වගාකර ඇති සොලනේසි කුලයේ බෝගයක් සහ කුකර්බිටේසි කුලයේ බෝගයක් නම් කරන්න.

vi. මෙම ගොවිපලේ කොටසක පොල් වගාකර තිබූ අතර එහි පස වැලිපසක් විය. වැලි පසකට සුදුසු ජල සම්පාදන ක්‍රමය නම්කරන්න.

vii. මෙම භූමියේ වගාකර ඇති තක්කාලි වගාවේ අස්වැන්න පරිරක්ෂණය සඳහා යොදාගත හැකි ක්‍රම 2 ක් ලියන්න. (ල. 02)

viii. මෙම ප්‍රදේශයේ වගාබිම්වලට වැඩිපුර ජලය ලබාගන්නේ වැව් වලිනි. (ල. 02)
වැවක ජල පීඩනය පාලනය කිරිම සඳහා වැදගත් වන කොටස කුමක්ද ? (ල. 02)

ix. මෙම වගාවේ බණ්ඩක්කා පාත්තියේ තැනින් තැන පත්‍ර කහ පැහැවි ඵල විකෘති වි තිබෙනු දක්නට ලැබුණි. මෙම රෝගය කුමක් විය හැකිද ? (ල. 02)

x. මෙම වගා භූමියේ තවානක තිබූ සමහර පැළ මුලින් කඩා වැටී කුණු වි තිබුණි. එම රෝගය කුමක් විය හැකිද ? (ල. 02)

02. ලංකාවේ තෙත් කලාපයට මැයි සිට සැප්තැම්බර් දක්වා අධික වැසි සහිත කාලගුණික තත්ත්වයක් ඇති වේ.

i. අ) මෙම කාලය තුළ බල පැවැත්වෙන වගා කන්නය කුමක්ද ? (ල. 01)

ආ) එම කනන්ය සඳහා වර්ෂාව ලැබෙන ක්‍රමය නම්කරන්න. (ල. 01)

ii. වර්ෂාපතනය මැනීම සඳහා භාවිතා කරන සරල වර්ෂාමානයක රූප සටහනක් ඇඳ නම්කරන්න. (ල. 02)

iii. අ) අධික සුලඟ නිසා බෝග වලට සිදුවන අහිතකර බලපෑම් 2 ක් ලියන්න (ල. 01)

ආ) වැසි කාලයේදී පරිසර තත්ත්ව පාලනය කරමින් බෝග වගා කළ හැකි දියුණු තාක්ෂණික ක්‍රමයක් නම් කරන්න. (ල. 01)

ඇ) එම ක්‍රමය තුළ පාලනය කළ හැකි පරිසර සාධක 2 ක් නම් කරන්න. (ල. 02)

iv. පිටාර ජල සම්පාදනයේ වාසි හා අවාසි 2 බැගින් ලියන්න. (ල. 02)

03. බෝග වගාවේ ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීම සඳහා පළිබෝධ හානි අවම වන ලෙස පස, ජලය, රෝපණ ද්‍රව්‍ය, පොහොර, යන්ත්‍රෝපකරණ ආදී සම්පත් කළමණාකරණය කළ යුතු වේ.

i. අ) බෝග වගාවේ වල් මර්ධනය සඳහා යොදා ගතහැකි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම 2 ක් ලියන්න.

ආ) වල් මර්ධනය සඳහා මිනිස් බලයෙන් ක්‍රියකරන උපකරණ 2 ක් නම් කරන්න. (ල. 03)

ii. සොලනේසි කුලයේ බෝගවලට වැළඳෙන බැක්ටීරියා රෝගයක් නම්කර එහි රෝග ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 03)

iii. අ) බෝගයක වර්ධක අවධියේදී වැඩිපුරම අවශ්‍ය වන්නේ කුමන මූල ද්‍රව්‍යයද ?

ආ) එම මූලද්‍රව්‍ය ඌනතාවය නිසා ඇතිවන ලක්ෂණයක් ලියන්න. (ල. 02)

iv. බෝග වගාව සඳහා යොදන පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සැලකිලිමත්විය යුතු කරුණු 2 ක් ලියන්න. (ල. 02)

04. ජලය අප සතු වටිනා සම්පතකි. එසේම බෝග වගාවේදී ජල කළමණාකරණ උපාය මාර්ග අනුගමනය කිරිම තුළින් ශාකවලට අවශ්‍ය පෝෂණ සංඝටකද ලබාගැනීම පහසු වේ.

i. අ) පසෙන් ජලය ඉවත්වන ක්‍රම 2 ක් ලියන්න. (ල. 01)

ආ) පසට වසුන් යෙදීම සඳහා යොදාගත හැකි ස්වභාවික වසුන් හා කෘතිම වසුන් 2 බැගින් ලියන්න. (ල. 02)

ii. අ) යහපත් ජල වහනයේ වාසි 2 ක් ලියන්න. (ල. 01)

ආ) ප්‍රධාන ජල වහන ක්‍රම 2 ක් සඳහන් කරන්න. (ල. 02)

iii. අ) ශාක පෝෂණයට අවශ්‍ය මහා පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක 2 බැගින් ලියන්න. (ල. 01)

ආ) ඔබ දන්නා කාබනික දියර පොහොර වර්ගයක් සකසා ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

05. එක්තරා ගොවි මහතෙක් තම කුඹුරේ සංස්ථාපනය සඳහා සුදුසු බිත්තර වී සපයා ගැනීමට ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් උපදෙස් පැතීය. ඔහුට ලබාදුන් තොරතුරු අනුව,

i. අ) බිත්තර වී වල තිබිය යුතු ප්‍රමිති 2 ක් සඳහන් කරන්න. (ල. 01)

ආ) ඔහු විසින් තවාන් මගින් පැළ ලබා ගැනීමට තීරණය කළේ නම් සැකසිය හැකි තවාන් වර්ග 2 ක් ලියන්න. (ල. 02)

ii. වී වගාවේ යොදාගන්නා පශ්චාත් සාත්තු 4 ක් සඳහන් කරන්න. (ල. 02)

iii. වී වගාවට යෙදිය හැකි කාබනික පොහොර වර්ග 2 ක් සඳහන් කරන්න. (ල. 01)

iv. ගොයම් සංස්ථාපනයෙන් ටික කලකට පසු කුඹුරේ තැනින් තැන වෘත්තාකාර දුඹුරු පැහැති හානි වූ ප්‍රදේශ දක්නට ලැබිණි.

අ) එය කුමන පළිබෝධකයාගේ හානියක් විය හැකිද ? (ල. 01)

ආ) එම හානිය හඳුන්වන නම කුමක්ද ? (ල. 01)

ඇ) එම හානිය වලක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න. (ල. 02)

06. ගොවි මහතෙක් අලෙවිය සඳහා එළවළු පැළ සහ පළතුරු පැළ නිෂ්පාදනය කිරීමට රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ගොවිපලක් ආරම්භ කළේය.

i. අ) එළවළු බීජ තවාන් දැමීම සඳහා යොදා ගතහැකි තවාන් බඳුන් වර්ග 4 ක් ලියන්න. (ල. 02)

ආ) දඬු කැබලි මුල් ඇදීම උත්තේජනය කරන හෝමෝන වර්ග 2 ක් ලියන්න. (ල. 01)

ii. අ) බද්ධ කිරීමේදී යොදා ගන්නා අනුජයක් හා ග්‍රාහකයක තිබිය යුතු ලක්ෂණ 2 බැගින් ලියන්න. (ල. 02)

ආ) බිමට නැමිය නොහැකි අතු සහිත ශාකයක අත්තක් ගසේ තියබිදීම මුල් අද්දවා ගතහැකි ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ල. 03)

iii. ගොවි මහතා එක් අවස්ථාවක දඬු කැබලි මගින් පැළ ලබාගැනීමට සරල සූර්ය ප්‍රචාරකයක් භාවිතා කළේය. එහිදී

අ) ගොවියා විසින් යොදාගත යුතු රෝපණ මාධ්‍ය කුමක්ද ? (ල. 01)

ආ) පොලිතීන් ගෘහයක උෂ්ණත්වය පාලනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල. 01)

07. අතීතයේ සිට වර්තමානය දක්වා කරන ලද අත්හදාබැලීම් තුලින් බිහි වූ විවිධ ගොවිතැන් ක්‍රම හා වගාරටා දැනට භාවිතයේ ඇති අතර සංවර්ධිත රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව වැනි රටවල පසු අස්වනු හානිය 20% ත් 40% ත් පමණ ඉහළ අගයක් ගනී.

i. ශ්‍රී ලංකාවේ ගොවීන් අනුගමනය කරන ගොවිතැන් පද්ධති 2 ක් නම්කරන්න. (ල. 02)

ii. අ) අතුරු බෝග වගාව යනු කුමක්ද ? (ල. 02)

ආ) ඒ සඳහා උදාහරණයක් ලියන්න. (ල. 02)

iii. පසු අස්වනු හානිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක කුමක්ද ? (ල. 02)

iv. පසු අස්වනු හානිය සිදුවිය හැකි අවස්ථා දෙකක් නම්කරන්න. (ල. 02)

v. කෘෂි බෝගවල පසු අස්වනු හානිය අවමකිරීම සඳහා රජය මගින් මෑතකදී ගෙන ඇති පියවර කුමක්ද ? (ල. 02)